**ජාතික සමාජ සංවර්ධන ආයතනය - 2017**

**------------------------------------------------------**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත 2018 අගෝස්තු 31 දින නිකුත් කරන ලදි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික සමාජ සංවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.3,000,000 ක් වූ වාහන 02 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් අභ්‍යන්තර දුරකථන පද්ධතියට දැරූ රු.435,850 ක වියදම ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කිරීම වෙනුවට පුනරාවර්තන වියදම් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.50,690 ක ක්ෂය ප්‍රතිපාදනය කිරීම මගහැරී තිබුණු අතර වර්ෂයේ ඌණතාවය රු.385,160 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2006 ජනවාරි සිට 2014 දෙසැම්බර් දක්වා වූ කාලය වෙනුවෙන් හිඟ සේවක භාරකාර අරමුදලේ දායක මුදල් රු. 1,120,291 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. මෙම ගෙවීම් ඉකුත් වර්ෂ ගැලපීම් ලෙස සමුච්චිත අරමුදලට ගැලපිය යුතුව තිබුණ ද සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු.1,120,291 කින් වැඩියෙන් දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළව පාඨමාලා 22 කින් ලැබිය යුතු රු.4,595,450 ක්වූ පාඨමාලා ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) වත්කම් මිලදී ගැනීම සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණු රු.5,862,944 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස දැක්වීම වෙනුවට කාරක ප්‍රාග්ධන සංචලනයන් යටතේ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ වෙනස ලෙස රු.2,756,154 ක් පමණක් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රමක්ෂය ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ගලපා තිබුණු රු.3,106,790 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය නොවන අයිතම් ලෙස ඌනතාවයෙන් අඩුකිරීම වෙනුවට ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමෙන් හිලව් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස්කර තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වු නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීතිරීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 751 | රජයේ ආයතනවලට ලබාගන්නා සියළු භාණ්ඩ සහ පොත්පත් වහාම බඩු ලේඛණ පොතේ ඇතුළත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ රු.336,000 ක් වැයකර ප්‍රකාශන පොත් 700 මුද්‍රණය කර තිබුණද එම පොත් ලැබීම ගබඩාවේ තොග ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. |
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති අයිඒඅයි/ 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | එකතුව රු. 5,987,625 ක් වටිනා පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.. |

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු10,443,422 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,739,560 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සසදන විට සමාලෝචිත වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,703,862 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.සමාලෝචිත වර්ෂයේ වැටුප් හා වේතන රු.7,729,138 ක සහ පරිපාලන හා ආයතන වියදම් රු.6,131,072 ක වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සහ 2014 වර්ෂයේදී ඌනතාවයක්වූ අතර 2015 වර්ෂයේදී එය අතිරික්තයක්ද නැවත 2016 සහ 2017 වර්ෂයන් වලදී ඌනතාවයන් පැවතිණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.18,763,348 ක් වූ දායකත්වය 2015 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණද නැවත 2017 වර්ෂයේදී රු.40,362,184 දක්වා අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

ආයතනයේ කටයුතු කෙටිකාලීන සහ දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කිරීමට අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැළැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක කරා ළඟාවීමට හැකිවන පරිදි ආයතනය මෙහෙයවීම පාලක මණ්ඩලයේ පූර්ණ වගකීම වූවද ආයතනය සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

සංයුක්ත සැලැස්මේ ආයතනයේ ශක්තීන් (13) සහ දුර්වලතාවයන් (05) හඳුනා ගෙන තිබුණද, ඒවා ඇගයීමට ලක්කර එම සැලසුම් යාවත්කාලීන කර ඉදිරි වර්ෂ සඳහා අඛණ්ඩව ගෙනයාමට සංයුක්ත සැලැස්මක් සකස් කළ යුතුව තිබුණද එසේ කටයුතු කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරිත්වය සහ සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) පුහුණු අංශය**

(i) ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානවල සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍ය වලින් උපදේශන ඩිප්ලෝමා පාඨමාලා පවත්වා තිබුණු අතර වාර්ෂිකව උපදේශන ඩිප්ලෝමාධාරීන් 450 ක් පුහුණුව ලබාගෙන තිබුණි. මෙසේ පුහුණුව ලබාගත් ඩිප්ලෝමාධාරීන් ලබාගත් දැනුම සමාජයට ලබාදීමක් සිදුවන්නේදැයි ආයතනය විසින් පසුවිපරම් කිරීමක් සිදුකර නොතිබුණි.

(ii) පුහුණු අංශය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා සඳහා ඇතුළත් වූ සිසුන් සංඛ්‍යාව සහ පාඨමාලාව අවසන් කළ සිසුන් සංඛ්‍යාව සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති කාර්ය සාධන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.

**(ආ) සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය**

සමාජ සංවර්ධන ප්‍රතිපත්ති සැකසීම,පර්යේෂණ සිදුකිරීම සහ ප්‍රකාශන එළිදැක්වීම මෙම අංශය මඟින් සිදු කරනු ලබන අතර සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ වැඩ සටහන් 11 ක් සඳහා රු.1,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ..

(i) සමාලෝචිත වර්ෂයට අදාලව පර්යේෂණ ග්‍රන්ථ හා ශාස්ත්‍රීය සඟරා 720 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් රු.499,264 ක් වියදම් දරා තිබුණු නමුත් 2018 ජුලි 01 වන විටත් එම පොත් අදාළ අංශ වෙත බෙදා හැර නොතිබුණි. එසේම මෙම පොත් එළිදැක්වීම උත්සවය නොපැවැත්වීම නිසා වෙන් කර තිබුණු රු.140,000 ක් වූ ප්‍රතිපාදනය උපයෝජනය කිරීමකින් තොරව පැවතිණි.

(ii) පර්යේෂණ අංශය විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත්කරන පුවත් හසුනෙහි ආයතනයේ එක් එක් පාඨමාලාවල නම් පමණක් ඇතුළත් වූ නමුත් එහි පාඨමාලා මගින් සිසුන් ලබාගෙන ඇති ප්‍රගතිය, අනාගත දැක්ම සහ පාඨමාලා පිළිබඳව සිසුන්ගේ අදහස් ඇතුළත් කිරීමක් සිදුවී නොතිබුණි.

(iii) සමාජ සංවර්ධන ප්‍රතිපත්ති සැකසීම,පර්යේෂණ සිදුකිරීම මෙම අංශයේ කර්තව්‍යයන් ලෙස දක්වා තිබුණු අතර පර්යේෂණ නිලධාරීන් 06 ක් සහ සහකාර පර්යේෂණ නිලධාරීන් 06 ක් සේවය කරනු ලැබුවද එම නිලධාරීන් ඉකුත් වර්ෂය තුළදී ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබාදී තිබුණු වකුගඩු රෝගීන් සම්බන්ධව සමීක්ෂණයක් පමණක් සිදුකර වර්ෂය තුළ ඉටුකළයුතු පර්යේෂණ හඳුනාගෙන ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ පවත්නා පුස්තකාලයෙන් බැහැර ගෙන යන පොත් සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරය පිළිබඳව අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර 2015 වර්ෂයේ සිට 2017 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ආයතනයේ නිලධාරීන් 38 දෙනෙකු විසින් පොත් 229 ක් බැහැර ගෙනගොස් නැවත පුස්තකාලය වෙත භාරදී නොතිබුණි. එසේම මෙම ප්‍රමාදය පිළිබඳවද පොත් ලබාගත් නිලධාරීන් දැනුවත් කිරීමක්ද සිදුකර නොතිබුණි.

(ආ) ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුළ පුහුණු හා පර්යේෂණ අංශයට දේශන ශාලා පහසුකම් සඳහා රු.7,140,000 ක වාර්ෂික කුළියක් ගෙවා මහල් 04 කින් යුතු ගොඩනැගිල්ලක් කුලියට ගෙන එහි දේශන ශාලා 03 ක් වෙන්කර ගෙන තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ මෙන්ම 2018 වර්ෂයේද දේශන ශාලාවල පාඨමාලා පැවැත්වූ බවට පන්ති වාර්තා පොත් (Record Book) පවත්වාගෙන නොතිබීම නිසා අඛණ්ඩව දේශන ශාලා පහසුකම් ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය නොවීය.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 137 ක් වූ අතර, තත්‍ය සේවක සංඛ්‍යාව 121 ක් වුයෙන් පුරප්පාඩු තතතුරු 16 ක් විය. පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ මහාචාර්ය තනතුර 2014 වර්ෂයේ සිට විගණන දිනයවූ 2018 ජූලි 20 දින දක්වා වසර 04 කට ආසන්න කාලයක් පුරප්පාඩු වී පැවතියද 2018 ජූලි 20 දිනටත් මෙම බඳවා ගැනීම ප්‍රමාදව පැවතිණි.

(ආ) කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ආයතනය සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/E/3/20/07/159/2 හා 2010 ජුනි 24 දිනැති ලිපියෙන් ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරී තිදෙනෙකු අනුමත කර තිබුණද මෙම තනතුරු 02 ක් පුරප්පාඩුව තිබුණු බව නිරීක්ෂණය විය. අවුරුදු 6 ½ ක්ම ආයතනයේ පුහුණු අංශයේ අධ්‍යයන කටයුතු සිදු කිරීමට පුහුණු අංශයේ ක්‍රියාත්මක කරන සියළු පුහුණු පාඨමාලා සැලසුම් කිරීම, නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හා පුහුණු කිරීම සඳහා අවශ්‍ය පුහුණු කරුවන් හඳුනා ගැනීම හා පුහුණු කිරීම, වැඩ සටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම යන රාජකාරි ක්‍රියාත්මක කළ යුතු වුවත්, මෙම තනතුරු පුරප්පාඩුවී තිබීම හේතුවෙන් පුහුණු පාඨමාලා ප්‍රමාදයකින් තොරව පවත්වා ගැනීමට නොහැකිවූ අවස්ථාද නිරීක්ෂණය විය.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් සහ සත්‍ය ආදායම් වියදම් අතර සියයට 50 සිට සියයට 75 දක්වා පරාසයක් තුළ විචලනයන් නිරීක්ෂණය වූ බැවින් සඵල කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස අයවැය ලේඛනය යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

### 6.2 නොවිසඳී ඇති විගණන ඡේද

2014 අගෝස්තු 20 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී කාරක සභා නියෝග අංක 10 යටතේ රටේ ජනතාව අතර දිළිඳුකම පැවතීමට හේතු පාදක සම්බන්ධව පර්යේෂණයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව නියෝගය සමාලෝචිත වර්ෂය දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානය සඳහා යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් | පරිගනක උපාංග සහ මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබීම. |
| (ආ) කාර්ය මණ්ඩලය පරිපාලනය | පුරප්පාඩු පිරවීම ප්‍රමාද තත්ත්වයක පැවතීම |
| (ආ) සංයුක්ත සැළැස්ම | ආයතනය සංයුක්ත සැළැස්මක් සකස් කර නොතිබීම. |